# රජරට විශ්වවිද්‍යාලය

## 1996 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථා මාලාව.

### 1 කොටස

1985 අංක 07 සහ 1988 අංක 26 දරණ පනත් වලින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 112 (3) වගන්තිය සමග කියවිය යුතු 135 වගන්තිය යටතේ රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථාව.

1. මේ අතුරු ව්‍යවස්ථාව '1996 අංක 01 දරණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාව' යනුවෙන් හඳුන්වනු ලබන අතර, නිලවරණය පවත්වනු ලබන්නේ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා ද, ඒ අධ්‍යයන වර්ෂයේ 01 වන දින සිට ක්‍රියාතමක වන්නේය.

2. (මෙහි මින් මතු 'පනත' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් (සංශෝධිත) හෝ වෙනයම් සාධක පත්‍රයක් මගින් ප්‍රධාන විධායක නිලධාරී වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල කාර්ය සහ කර්තව්‍ය මෙම අතුරු ව්‍යවස්ථාවලියේ කිසිවකින් කිසිදු ආකාරයකින් හීන කරවන ලෙසට වටහා නොගත යුතුය.

3. (1) මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වීම මත මෙම අතුරු ව්‍යවස්ථාවේ 3(11) සහ 3(111) අනුඡේද වල සලසනු ලැබ ඇති විධිවිධාන ප්‍රකාරව රජරට විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සමිති සහ පීඨ ශිෂ්‍ය සමිති සංස්ථාපනය කරනු ලැබිය යුතුය.

   (11) 1988 අංක 26 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ උප ලේඛණයෙන් නිශ්චිතව දක්වා ඇති 1,1 (2). 2 සහ 3 වගන්ති වලින් විධිවිධාන සලසා ඇති පරිදි රජරට විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියට,සිය සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය සඳහා අධිකාර බලය ලැබෙන්නේය.

   (111) රජරට විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන පීඨයන් සඳහා පීඨ ශිෂ්‍ය සමිතියක් තිබිය යුතුය. 1988 අංක 26 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති 6(1), 6(2), 6(3) සහ 07 වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි එම. පීඨ ශිෂ්‍ය සමිති තමන්ගේ සංයුතිය, කාර්ය සහ කර්තව්‍යයන්ගේ අධිකාර බලය ලබා ගනී.

## 11 වැනි කොටස

4. පනත මගින් හෝ වෙනත් යම් සාධන පත්‍රයක් මගින් හෝ රජරට විශ්ව විද්‍යාලයයේ පාලන අධිකාරිය මත පවරන ලද හෝ නියම කරන ලද හෝ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ගේ පොදු අදාලත්වයට අගති විරහිතව, මෙම අතුරු ව්‍යවස්ථාවේ පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකිව යුතු වන්නේය.

5. පීඨයක ශිෂ්‍යයෙක්,

(අ) පූර්ණකාලීන උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙකු වශයෙන් නිසියාකාරව ලියාපදිංචි කොට ඇතුළත් කරගනු ලැබ නොමැත්තේ නම් හෝ නිලවරණය පැවැත්වෙන අධ්‍යයන වර්ෂය තුළ අදාල පීඨයෙහි අධ්‍යයන පාඨමාලාවක් නොහදාරයි නම් හෝ,

(ආ) පීඨයෙන් සහ/හෝ විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍ය භාවය අත්හිටවනු ලැබ ඇත්තේ නම් හෝ,

(ඇ) ඡන්දය දෙන අවස්ථාවේදී සිය අනන්‍යතාවය තහවුරු කිරීමට අසමත් වන්නේ නම් හෝ,
චන්දයකදී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත් වීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යාර්ථයන් සඳහා,

(1) ලියාපදිංචි ශිෂ්‍යයෙකු යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා විශ්වවිද්‍යාලයීය ලියාපදිංචිය ලබාගෙන විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇතුළත් කරගනු ලැබ ඇති කිසියම් උපාධි අපේක්ෂකයකු හෝ කිසියම් අධ්‍යයන වර්ෂයක් සඳහා හෝ වෙනත් අධ්‍යයන කාල පරිච්ඡේදයක් සඳහා හෝ කලින් කල අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම පිණිස නිසි පරිදි ඇතුළත් කරගෙන ලියාපදිංචි කරනු ලැබූ ශිෂ්‍යයෙකි.

7. (1) එක් එක් අධ්‍යයන වර්ෂයක ප්‍රථම වාරය ඇරඹී මාසයක් ඇතුළත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින්, විශ්වවිද්‍යාල සිමාවේ ඇලවිය

(අ) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියේ නම,

(ආ) එම එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා තේරාගතයුතුව ඇති නිලධරයන්ගේ තනතුරු නාම සහ අනෙක් සාමාජිකයන්ගේ සංඛ්‍යාව,

(ඇ) එබඳු එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධරයන් සහ වෙනත් සාමාජිකයන් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබන සියුන්ගේ නම් හා ලියාපදිංචි අංකයද ඇතුළත් කරමින් විශ්වවිද්‍යාල සීමාවන් ඇතුළත දැන්වීමක් ප්‍රසිද්ධ කළයුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රථම සමිතිය සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නියම කරනු ලැබිය හැකි දිනයකදී ඉහත කී දැන්වීම ප්‍රසිද්ධ කරනු ලැබිය හැකිය.

8. එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධාරීන් හා වෙනත් සාමාජිකයන් තෝරා ගැනීමේ නිලවරණය වෙනුවෙන් එම නිලවරණය පැවැත්වීම සඳහා පුද්ගලයෙකු (මෙහි මින් මතු නිලවරණ නිලධාරියා වශයෙන් හඳුන්වනු ලබන) නම හා තනතුරු නාමය සහිතව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නම් කළ යුතුය. මෙම කර්තව්‍යයෙහිලා කිසියම් පුද්ගලයකු හෝ පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ සහාය කර ගැනීමට නිලවරණ නිලධාරීට හැකි වන්නේය.

9. (1) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන්, එම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් හා අනෙක් සාමාජිකයන් තෝරා ගැනීමේ නිලවරණය සඳහා නිලවරණ නිලධාරී විසින් නාම යෝජනා භාරගැනීම අවසන් කරනු ලබන වේලාව, ස්ථානයක් සහ දිනයක් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නියම කරනු ලැබිය යුතුය. එම දිනය මෙම අතුරු ව්‍යවසථාවේ 7(1) වගන්තිය යටතේ දැන්වීම ප්‍රසිද්ධ කරනු ලබන දින සිට දින 08 ක් ඉකුත්වීමෙන් පසුව නමුත් දින 14 ක් ඉකුත්වීමට පෙරාතුව යෙදෙන දිනයක් විය යුතුය.

(11) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නාම යෝජනා භාරගැනීම සම්බන්ධයෙන් නියම කරනු ලබන දිනය, වේලාව හා පිළියෙල කරන ලද ස්ථානය අප්‍රමාදවම, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් විශ්වවිද්‍යාල සීමාව ඇතුලත ප්‍රසිද්ධ කළයුතුය.

(111) නාම යෝජනා ඉදිරිපත් කළයුත්තේ මෙම අතුරු ව්‍යවස්ථාවේ උප ලේඛනය 1 හි දක්වනු ලබන ආකෘතියක වේ. නාම යෝජනා පත්‍රයෙහි යෝජකගේ සහ ස්ථිර කරුගේ නම් ද ඔවුන්ගේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය ද ඇතුලත් විය යුතු අතර, නාම යෝජිතයා විසින් නිලවරණයට ඉදිරිපත්වීමට තම එකඟත්වය ප්‍රකාශ කිරීමේ සංකේතයක් වශයෙන් සිය අත්සන එහි යෙදිය යුතුවේ. ලියාපදිංචි සෑම උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙක්ම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකු හෝ සාමාජිකයෙකු වශයෙන් තෝරා ගැනීමේ අපේක්ෂකත්වයට නම් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේය යෝජකයන් සහ ස්ථිරකරුවන්, තමන් විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් අයත් පීඨයේම උපාධි අපේක්ෂකයන් විය යුතුය.

(1V) මොනයම් හෝ නිලවරණයක දී යම් සියුවෙකු එතකට වැඩි තනතුරු සංඛ්‍යාවකට හෝ එක යෝජකයෙකුට හෝ එක ස්ථිරකරුවෙකුට හෝ වැඩි සංඛ්‍යාවක් විසින් නාම යෝජනා කරනු ලැබීමට හෝ සුදුසුකම් නොලබන්නේය.

(V) මෙසේ ලැබෙන නාම යෝජනා පත්‍ර, නාම යෝජනා භාරගන්නට යෙදුන දිනට පසුව දින , නිලවරණ නිලධාරී විසින් පීඨ දැන්වීම් පුවරු මත ප්‍රදර්ශනය කරනු ඇත.

(V1) නාම යෝජනා කරනු ලැබ ඇති පුද්ගලයන් කෙරෙහි විරෝධතා ඇතොත් එම විරුද්ධතාවයට පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින්, නාම යෝජනා ප්‍රදර්ශනය කිරීමට පසුව එක දිනයක් ගතවන්නට පෙරාතුව එම පීඨයේ යම් උපාධි අපේක්ෂක සියුවෙකු විසින්, නිලවරණ නිලධාරී වෙත ඉදිරිපත් කළයුතුවේ. නාම යෝජනාවක් වලංගුද, නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ ප්‍රධාන විධායක නිලධරයා විසින් වන අතර, එම තීරණය අවසන් තීරණය ද වේ.

10\. (1) යම් පීඨ ශිෂ්‍ය සමිතියක එක් එක් තනතුර සම්බන්ධයෙන් එක් නාම යෝජනා පත්‍රය බැගින් පමණක් ලැබ ඒවා පිළිගනු ලැබ ඇති අවස්ථාව ඒ ඒ නිලය සඳහා එම නාම යෝජනා පත්‍රයෙහි නිශ්චිත අපේක්ෂකයන් තෝරා ගන්නා ලද බව නිලවරණ නිලධාරී විසින් ප්‍රකාශයට පත් කළයුතුය.

(11) නාම යෝජනා පත්‍ර ලැබී නොමැති විටකදී, එම පීඨ ශිෂ්‍ය සමිතිය පිළිබඳව, ප්‍රධාන විධායක නිලධාරීගේ උපදෙස් මත නිලවරණ නිලධාරී විසින් නාම යෝජනා භාරගැනීම සඳහා අලුතින් දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කරනු ලැබිය යුතුය.

11\. (1) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට නිලධාරීන් හා වෙනත් සාමාජිකයන් තෝරාගැනීම සඳහා දිනයක් නියම කළයුතුවේ. එම දිනය, එකී පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නාම යෝජනා පත්‍ර ලබාගන්නා දින සිට දින 14 ක් ඇතුලත වැනෙන දිනයක් විය යුතු අතර, එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා නිලවරණ පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරගනු ලබන දිනය ද එයම විය යුතුය.

(11) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය වෙනුවෙන් නිලධරයන් හා වෙනත් සාමාජික යන් තේරීම සඳහා නියම කරගනු ලබන දිනය, වේලාව හා ස්ථානය ද විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින්, විශ්වවිද්‍යාල සීමාව ඇතුලත ප්‍රසිද්ධ කළයුතු වේ.

(111) නිලවරණ නිලධාරී විසින් රහස් ඡන්ද නිලවරණ පැවැත්විය යුතුය.

12. පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයකදී තරඟ කරන එක් එක් අපේක්ෂකයාට, ඡන්දය පාවිච්චි කිරීමේ සහ ගණන් කිරීමේ කාලය තුළදී, ඡන්දය පවත්වන ස්ථානයේදී තමා නියෝජනය කිරීම සඳහා ඡන්ද ඒජන්තවරුන් වශයෙන් සියුත් දෙදෙනෙකු පත්කර ගැනීමට පුලුවන. එබඳු සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම පත්කරනු ලබන ශිෂ්‍යයන්ගේ නම් සහ ලියාපදිංචි අංක සඳහන් කරමින් අපේක්ෂකයා විසින් ඡන්දය ආරම්භ කිරීමට මත්තෙන් නිලවරණ නිලධාරී වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එසේ තුඩුවූවත්, ඡන්දය පාවිච්චි කිරීමේ හෝ ගණන් කිරීමේ හෝ මොනයම් අවස්ථාවකදී වුවද ඡන්ද පොළ වෙත පෙනී සිටිය හැක්කේ ඉන් එක් ඡන්ද නියෝජිතයෙකුට පමණි.

13. (1) 1988 අංකය 26 දරණ සංශෝධන විශ්වවිද්‍යාල පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි සෑම ලියාපදිංචි ශිෂ්‍ය යෙකුටම, පීඨ ශිෂ්‍ය සමිති නිලවරණයක දී එක් තනතුරක් සඳහා එක් අපේක්ෂකයෙකුට ද, එම පීඨ ශිෂ්‍ය සමිතියට තේරා ගනු ලැබීමට නියමිත අනෙකුත් සාමාජික සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවකටද ඡන්දය දීමට හිමිකම් තිබිය යුතුය.

(11) එක් එක් නිලය සඳහා ඉහළම ඡන්ද සංඛ්‍යාවක් ලද අපේක්ෂකයා තේරා පත්කර ගනු ලැබූ බව නිලවරණ නිලධාරියා විසින් ප්‍රකාශයට පත්කළයුතුවේ.

(111) 1988 අංක 26 දරණ සංශෝධන පනතේ උප ලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි එක් එක් පීඨය සඳහා නිලවරණයකදී තේරාගනු ලබන සාමාජිකයින් සංඛ්‍යාව යම් තරම් වේද, එම සංඛ්‍යාවට සමාන වන තෙක් අවරෝහණ ක්‍රමයට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා අපේක්ෂකයින් සාමාජිකයන් වශයෙන් තේරා පත්වී ඇති බව නිලවරණ නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතුය.

(1V) නිලධරයෙකු හෝ වෙනත් සාමාජිකයෙකු හෝ තේරා ගැනීම සඳහා පැවැත්වෙන නිලවරණයකදී අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව අතර සමානත්වයක් ඇති බව පෙනී යන අවස්ථාවකදී තේරාගත යුතු නිලධරයා/ සාමාජිකයා කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතුය.

14. (1) පීඨ ශිෂ්‍ය සමිතියක එක් එක් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු, තමන් තේරාගනු ලබන දින සිට එසේ තෝරාගනු ලැබූ අදාල අධ්‍යයන වර්ෂයේ අවසන දක්වා එම නිලය දැරිය යුතුවේ.

(11) එක් අධ්‍යයන වර්ෂයකට වඩා කාලයක් සඳහා එම නිලයම දැරීමට හෝ එම නිලයටම නැවත තෝරා පත්කර ගනු ලැබීමට හෝ කිසිදු සිසුවෙකු හිමිකම් නොලැබිය යුතුය.

(111) කිසියම් නිලධරයෙකු හෝ සාමාජිකයෙකු,

(අ) තවදුරටත් ශිෂ්‍යයෙකු නොවන්නේ නම් හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත සිය අත්සන යටතේ ලිඛිතව දන්වා තනතුරෙන් ඉල්ලා අස්වේ නම් හෝ

(ඇ) විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍ය භාවය තහනම් කරනු ලැබූ හෝ නෙරපනු ලැබ ඇත්නම් හෝ,

ඔහුගේ නිලය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතුය.

(1V) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයෙකුගේ/සාමාජිකයෙකු ගේ තනතුර පුරප්පාඩු වන අවස්ථාවකදී එම පීඨයේ සිසුන් විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ කලින් විධිවිධාන වලට අනුකූලව ප්‍රධාන විධායක නිලධාරි විසින් තීරණය කරනු ලබන පරිදි එම පුරප්පාඩුව පිරවීම සඳහා පුද්ගලයෙකු තේරීම පිණිස නිලවරණයක් පැවැත්වීමට කටයුතු ආරම්භ කළයුතුය. එසේ තෝරාගනු ලැබූ පුද්ගලයා ස්වකීය පූර් ප්‍රාප්තිකයාගේ නිල කාලයෙන් නොගෙවුනු කාල පරිච්ඡේදය සඳහා එම තනතුර දරන්නේය.

15. (1) ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය,

(අ) පීඨ ශිෂ්‍ය සමිති සියල්ලකම මූලසුන දැරීම,

(ආ) පීඨ ශිෂ්‍ය සමිතියේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියේ රැස්වීම් කැඳවීම, විය යුතුය.

(11) පීඨ ශිෂ්‍ය සමිතියේ උප සභාපතිගේ කාර්ය සහ කර්තව්‍ය,

(අ) සභාපති නොපැමිණි අවස්ථාවලදී පීඨ ශිෂ්‍ය සමිතියේ කිසියම් රැස්වීමක මූලසුන දැරීම.

(ආ) සභාපතිගේ රාජකාරි ඉටු කිරීමෙහිලා ඔහුට සහායවීම සහ

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතිය විසින්, ඔහුට පවරනු ලැබ ඇති වෙනත් කිසියම් රාජකාරි හෝ කාර්යය ඉටු කිරීම විය යුතුය.

(III) පීඨ ශිෂ්‍ය සමිතියේ ලේකම් ගේ කාර්ය හා කර්තව්‍ය:

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ සභා කෘතිවල ලේඛන පවත්වා ගැනීම

(ආ) සභාපතිගේ උපදෙස් මත හෝ පීඨ ශිෂ්‍ය සමිතියේ මුළු සාමාජිකත්වයෙන් 1/3 කට අඩු නොවන සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට හෝ පීඨ ශිෂ්‍ය සමිති රැස්වීම් කැඳවීම සහ

(ඇ) විශ්වවිද්‍යාලයේ කිසියම් සිසුවෙකුට පරීක්ෂා කිරීම සඳහා සභා කෘතිවල වාර්තා ලබාදෙන බව සහතික කිරීම ද, විය යුතුය.

(IV) පීඨ ශිෂ්‍ය සමිතියේ කනිෂ්ඨ භාණ්ඩාගාරිකගේ කාර්ය හා කර්තව්‍යය:

(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ අරමුදල් භාරයේ තබාගැනීම,

(ආ) සියලුම ආදායම් හා වියදම්, එම ගිණුම් පවත්වා ගැනීමට අදාල යම් නීතියකට යටත්ව, එම කාර්යය සඳහා පවත්වාගනු ලබන පොත්වල නියමාකාරයෙන් වාර්තා කර ඇති බවට වගබලා ගැනීම,

(ඇ) පීඨ ශිෂ්‍ය සමිතියට යම්කිසි ගෙවීමක් කළ විට එම ගෙවීම පිළිබඳව සතියක් ඇතුලත දී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම.

(ඈ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ගේ අනුමැතිය ඇතිව පීඨ ශිෂ්‍ය සමිතියේ අරමුදල් වලින් ගෙවීම් කිරීම,

(ඉ) පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් තේරීම් දින සිට මසක කාලයක් තුලදී, එම නිලධාරීන් සමග සාකච්ඡා පැවැත්වීමෙන් පසුව අධ්‍යයන වර්ෂය සඳහා අයවැය වාර්තාවක් පිළියෙල කිරීම.

(ඊ) අවශ්‍ය විටදී පරිපූරක ඇස්තමේන්තුව පිළියෙල කිරීම,

(උ) එක් එක් අධ්‍යයන වාරයේ අවසාන දින වනවිට පීඨ ශිෂ්‍ය සමිතියේ ජංගම සහ පූර්වානුමතය කළ මුදල් තත්වය පිළිබඳව වාර්තාවක්, අදාල සෑම වාරයකම අවසන අන්තිම මාසය තුලදී පීඨ ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කිරීම සහ

(ඌ) පීඨ ශිෂ්‍ය සමිතිය තෝරාගනු ලැබූ අධ්‍යයන වර්ෂය සඳහා එම ශිෂ්‍ය සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශනයක් සහ එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද, එම වර්ෂය අවසානයේ සති 2 ක් ඇතුලතදී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

## 111 වන කොටස

16. (1) ප්‍රධාන විධායක නිලධාරියා විසින්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ප්‍රධාන රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් යෙදිය යුතු අතර, එම රැස්වීමේදී පීඨ ශිෂ්‍ය සමිතිවල සියලුම සාමාජිකයන් විසින්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියේ නිලධරයන් (තමන් අතුරෙන්ම) තෝරා ගතයුතු වේ. එම දිනය, මෙම් අතුරු ව්‍යවස්ථාවේ 11 කොටසේ අදාල වගන්ති වලට අනුව පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධරයන් හා වෙනත් සාමාජිකයන් තෝරා ගනු ලැබීමෙන් සති 02 ක කාලයක් ඇතුළත එළඹෙන දිනයක් විය යුතුය.

(11) මෙම රැස්වීමේ කාර්යාර්ථයන් සඳහා, රහස් ඡන්දයක් මගින් නිලධරයන් තේරීමේ නිලවරණය පැවැත්වීම පිණිස තේරීම් භාර නිලධාරී වශයෙන් විශ්වවිද්‍යාලයයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු, ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලැබිය යුතුය. හෙතෙම එම රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, නිර්බාධිතව නිලවරණය පැවැත්වීම සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම පියවර ගත යුතුය.

(111) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වශයෙන් ප්‍රධාන විධායක නිලධාරී විසින් පත් කරගනු ලැබීම සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය වරයෙකු නිලධරයන් තේරීම අවසානයේදි විශ්වවිද්‍යාල සමිතිය විසින් නම් කරනු ලැබිය යුතුය.

(1V) තේරීම් භාර නිලධාරී විසින් ප්‍රධාන විධායක නිලධාරී වෙත, යථෝක්ත නිලවරණය සම්බන්ධ වාර්තාවක්ඉදිරිපත් කළයුතුවේ.

17. (1) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ එක් එක් නිලධරයා , ඔහුව තෝරාගනු ලබන දින සිට අදාල අධ්‍යයන වර්ෂයේ අවසානය දක්වා තම නිලය දැරිය යුතුවේ.

(11) කිසිදු සාමාජිකයෙකු එක් අධ්‍යයන වර්ෂයකට වඩා එම නිලයම දැරීමට හෝ එම නිලයටම නැවත වරක් තේරී පත්වීමට හෝ සුදුසුකම් නොලබයි.

(111) යම් නිලධරයෙකු,
(අ) ඉදිරියටත් ශිෂ්‍ය භාවයේ රැඳී සිටින්නේ නම් හෝ
(ආ) සිය අත්සනින් යුතුව ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත, නිලයෙන් ඉල්ලා අස්වීමේ ලියවිල්ලක් භාරදෙන්නේ නම් හෝ
(ඇ) විශ්වවිද්‍යාලයෙන් අත්හිටුවා හෝ නෙරපනු ලැබඇත්තේ නම් ... නිලය පුරප්පාඩු වී ඇති බවට සලකනු ලැබේ.

(1V) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියක නිලයක් පුරප්පාඩුවක් ඇති විටකදී විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා තීරණය කර ඇති පරිදි විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතිය විසින්, නිලධරයෙකු/සාමාජිකයෙකු තේරීම සඳහා නිලවරණයක් පැවැත්වීම පිණිස කටයුතු ආරම්භ කළයුතුය.

18. (1) මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමිත 15 (1) වගන්තියට අනුකූලව විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය පීඨ ශිෂ්‍ය සමිතියේ සභාපතිගේ කාර්ය හා කර්තව්‍ය වලට සමාන වන්නේය

(11) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ උප ස්භාපතිගේ කාර්ය සහ කර්තව්‍ය, මෙම අතුරු ව්‍යවස්ථාවල 15(11) වගන්තියෙහි පරිදි පීඨ ශිෂ්‍ය සමිතියේ උප සභාපති තනතුරෙහි නියමිත කාර්ය හා කර්තව්‍ය වලට සමාන වේ.

(111) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ලේකම් ගේ කාර්ය සහ කර්තව්‍ය මෙම ව්‍යවස්ථාවේ 15 (111) වගන්තියෙහි නිශ්චිත පරිදි, පීඨ ශිෂ්‍ය සමිතියේ ලේකම්ගේ කාර්ය හා කර්තව්‍ය වලට සමාන වේ.

(1V) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික සතු කාර්ය හා කර්තව්‍ය,

(අ) සියළුම ආදායම් හා වියදම්, එම ගිණුම් පවත්වා ගැනීමෙහිලා අදාල නීති රෙගුලාසි වලට යටත්ව, ඒ සඳහා නියමිත පොත් වල නියමාකාරයෙන් වාර්තාගත කර ගිණුම් ගතකර ඇති බවට වගබලා ගැනීම.

(ආ) සංගමයට ගෙවනු ලබන යම් මුදලක් වේනොත්, එබඳු මුදල් ගෙවීම් සම්බන්ධයෙන් සතියක කාලයක් තුලදී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත දැනුම් දීම.

(ඇ) ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ගේ අනුමැතිය ඇතිව සමිතියේ අරමුදල් වලින් මුදල් ගෙවීම් කිරීම.

(ඇ) සමිතියේ නිලධාරීන් තෝරාගනු ලබන දින සිට මාසයක කාලයක් තුලදී අදාල අධ්‍යයන වර්ෂය සඳහා අයවැය පිළියෙල කොට එය සමිතිය වෙත ඉදිරිපත් කිරීම, (මෙම කාර්ය සඳහා නිලධාරීන් සමග හෝ සමිතියේ ස්ථාවර කමිටුවක් ඇත්නම් ඒ අය සමග හෝ සාකච්ඡා කිරීමට ඔහුට පුලුවන.

(ච) අවශ්‍ය විටදී, පරිපූරක ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(ඡ) සමිතිය සේවාසනු ලැබූ අධ්‍යයන වර්ෂය අවසානයේ සති දෙකක කාලයක් ඇතුළත දී අධ්‍යයන වර්ෂය සඳහා සමිතියේ ආදායම් වියදම් ප්‍රකාශනය ද එම වර්ෂයේ අවසාන දිනට ශේෂ පත්‍රයක් ද, එකී වර්ෂය අවසානයේ සති 02 ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් විගණක වරයා වෙත ඉදිරිපත් කිරීම.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ අර්ථනිරූපන සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් පාලක සභාව වෙත යොමු කළයුතු වනඅතර, පාලක සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ-සනාතන සභාව විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලැබුවහොත් මිස, 'අධ්‍යයන වර්ෂය' යනුවෙන් අදහස් වන්නේ, යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ඇරඹී ඊට පසු වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන්නාවූ කාල පරිච්ඡේදය වේ.

'පනත' යනු, 1978 අංක 16 දරණ සංශෝධිත පනත වේ.

'විගණක' යන්නෙන්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය සමිතියේ හෝ සම්පිඨ ශිෂ්‍ය සමිතියක ගිණුම් විගණනය සඳහා ප්‍රධාන විධායක නිලධාරි විසින් පත්කරනු ලබන කිසියම් විගණකවරයෙකු අදහස් වේ.

'පාලක සභාව' යනු රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව වේ.

'පීඨාධිපති' යන්නෙන්, එක් එක් පීඨයෙහි පීඨාධිපති වරයා හෝ අවස්ථානු-කූලව පීඨාධිපති සඳහා වැඩබලන වෙනත් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

'පීඨය' යනු පනත යටතේ රජරට විශ්වවිද්‍යාලය මගින් සංස්ථාපිත කිසියම් පීඨයක් වේ.

'ප්‍රධාන විධායක නිලධාරි' යන්නෙන්, උපකුලපති හෝ අවස්ථානුකූලව උපකුලපති ධූරයෙහි රාජකාරි ඉටුකරන්නා වූ වෙනත් කිසියම් පුද්ගලයෙකු හෝ අදහස් වේ.

'ලේඛකාධිකාරි' යන්නෙන්, රජරට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි හෝ අවස්ථානුකූලව ලේඛකාධිකාරි වෙනුවට වැඩබලන වෙනත් කිසියම් පුද්ගලයෙකු අදහස් වේ.

'සනාතන සභාව' යන්නෙන්, රජරට විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ.

'අධ්‍යයන පාඨමාලාවක් හදාරන' යන්නෙන්, කිසියම් අධ්‍යයන පාඨමාලාවක් අරඹන ලදුව එම පාඨමාලාව හැදෑරීමෙහි නියුතු ලියාපදිංචි සිසුන් අදහස් කෙරේ.

'තිලවරණ නිලධාරි' යන්නෙන්, ඡන්දය පැවැත්වීමේ කාර්යය මෙහෙයවීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි විසින් පත් කරන ලබන තැනැත්තා අදහස් කෙරේ.